# HRMI දත්ත ආරක්ෂණය සහ පෞද්ගලිකත්ව ප්‍රතිපත්තිය

අපගේ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් මාත්‍රික සංවර්ධනයේ කොටසක් ලෙස HRMI විසින් පෞද්ගලික හා සංවේදී තොරතුරු එක් රැස් කරයි. මෙම දත්ත කට්ටල දෙක වෙන වෙනම ගබඩා කර ඇත:

1. විභව විශේෂඥ සමීක්ෂණ ප්‍රතිචාර දක්වන්නන් සහ ඔවුන්ව ඊට නම් කළ පුද්ගලයින්ගේ නම සහ සම්බන්ධ කර ගැනීමේ තොරතුරු ඇතුළු පුද්ගලික තොරතුරු.
2. අපගේ වාර්ෂික විශේෂඥ සමීක්ෂණයේ සමීක්ෂණ ප්‍රතිචාර (හඳුනා නොගත්/නිර්නාමික).

ඔබ සම්බන්ධයෙන් අප සතුව ඇති ඕනෑම පෞද්ගලික තොරතුරක පිටපතක් ඉල්ලා සිටීමට ඔබට අයිතියක් ඇති අතර, එය සාවද්‍ය නම් නිවැරදි කරන ලෙස හෝ මකා දමන ලෙස ඉල්ලා සිටීමට ද ඔබට අයිතියක් ඇත. යම් පෞද්ගලික තොරතුරක පිටපතක් ඉල්ලා සිටීම හෝ, එය සාවද්‍ය නම් නිවැරදි කරන ලෙස හෝ මකා දමන ලෙස ඉල්ලා සිටීම සඳහා survey@humanrightsmeasurement.org ඔස්සේ අප හා සම්බන්ධ වන්න

අප විසින් ඉහත තොරතුරු සුරක්ෂිතව තබා ගන්නා ආකාරය පහත දක්වා ඇත.

## 1. විභව සමීක්ෂණ ප්‍රතිචාර දක්වන්නන්ගේ නම් සහ සම්බන්ධ කර ගැනීමේ තොරතුරු

මෙම තොරතුරු අදියර දෙකක් යටතේ එක්රැස් කරනු ලැබේ. පළමුව, අපගේ ප්‍රාදේශීය හවුල්කරුවන්, අපගේ විශ්වාසය දිනූ හවුල්කාර සංවිධාන නියෝජනය කරන පිරිස්, සහ ඇතැම් අවස්ථාවල, වත්මන් සමීක්ෂණ ප්‍රතිචාර දක්වන්නන් ආදී HRMI මඟින් පත් කරන ලද නියෝජිතයින් අතරින් සමීක්ෂණය සඳහා ඇතුළත් කර ගැනීමට සුදුසු මානව හිමිකම් පිළිබඳ පුහුණුව ලද අය (සුරක්ෂිත මාර්ගගත පෝරමයක් මඟින්) නම් කෙරෙනු ඇත. අනතුරුව, නම් කරන ලද පුද්ගලයින්ගෙන් සමීක්ෂණය සඳහා සහභාගීවීමට කැමති දැයි විමසනු ලැබේ. ඔවුන් ඊට එකඟත්වය පළ කරන්නේ නම්, ඔවුහු සුරක්ෂිත මාර්ගගත එකඟතා පත්‍රයක් හරහා සිය නම සහ විද්‍යුත් තැපැල් ලිපිනය ලබා දෙති. අපගේ ආරක්ෂිත ප්‍රතිපත්තියේ මූලිකාංග:

- HRMI වෙබ් අඩවිය සියලුම මාර්ගගත පෝරම සඳහා සත්කාරකත්වය දරනු ලබයි, එයට SSL සහතිකයක් ඇති අතර https මඟින් සුරක්ෂිත කර ඇත. මෙයින් අදහස් වන්නේ තොරතුරු මාර්ගස්ථ අවධියේ දී සුරක්ෂිත (ගුප්ත කේතිත) බවයි.
- එකඟතා පත්‍රය ඔස්සේ ලබා දෙන ලද නම් සහ විද්‍යුත් තැපැල් ලිපින (ගුපත් කේතිත) ඍජුවම අපගේ පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ (CRM) මෘදුකාංගය වෙත යවනු ලැබේ. මෙම ක්ලවුඩ්-පාදක CRM මෘදුකාංගය 27001, 27017 සහ 27018 ඇතුළුව අදාළ සියලුම ආරක්ෂක ISO ප්‍රමිතීන්ට අනුව සහතික කර ඇත, එමඟින් සියලු තොරතුරු ග්‍රහණය කර ගැනීම, කළමනාකරණය කිරීම සහ සංකේතාත්මක ආකාරයෙන් රඳවා තබා ගැනීම සහතික කරයි. CRM වෙත ප්‍රවේශ වීම නවසීලන්තයේ සිටින HRMI කාර්ය මණ්ඩලයේ කුඩා කණ්ඩායමකට පමණක් සීමා වේ.
- මෙම එක් එක් විභව සමීක්ෂණ ප්‍රතිචාර දක්වන්නන් වෙත HRMI හි මාර්ගගත විශේෂඥ සමීක්ෂණයට අනන්‍ය සබැඳියක් යැවීමට HRMI මෙම තොරතුරු භාවිත කරයි.

- සමීක්‍ෂණයට ඇතුළත් වීම සඳහා නම් කර ඇති නමුත් එකඟතා පත්‍රය සම්පූර්ණ නොකරන පුද්ගලයින්ගේ නම් CRM දත්ත ගබඩාවට එක් නොකරන අතර සෑම වසරකම දත්ත නිකුත් කිරීමෙන් පසු සියලුම නාමයෝජනා විස්තර මකා දමනු ලැබේ.

## 2. සමීක්ෂණ ප්‍රතිචාර

සමීක්ෂණය SSL සහතිකය ලත් Qualtrics වෙබ් අඩවිය මගින් සත්කාරක කෙරෙන අතර, https මගින් සුරක්ෂිත කර ඇත. එයින් අදහස් වන්නේ ඇතුළත් කෙරෙන හා සම්ප්‍රේෂණය කෙරෙන සියලුම තොරතුරු ගුප්ත කේතනය කෙරෙන බව ය. IP ලිපින ගබඩා නොවේ. ජෝර්ජියා සරසවියේ (UGA) ගෝලීය ගැටලු අධ්‍යයන මධ්‍යස්ථානය (GLOBIS) පාදකව සිටින කුඩා HRMI කාර්ය මණ්ඩලයකට පමණක් Qualtrics ප්‍රතිචාර දත්ත වෙත ප්‍රවේශ වීම සීමා කර ඇත.

සමීක්ෂණ ප්‍රතිචාර දක්වන්නන්ට ඇති ප්‍රධාන විභව අවදානම වන්නේ, ඔවුන්ගේ විද්‍යුත් තැපෑලෙන් අනවසරයෙන් දත්ත ලබා ගෙන ඇත්නම් හෝ ඔවුන් අවේක්ෂණයේ සිටී නම්, සතුරු නියෝජිතයින් විසින් ඔවුන් HRMI සමඟ සන්නිවේදනය කරන බව දකින අතර ඔවුන් අපගේ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් ප්‍රමිතිකවලට දායක වන බව දැන ගනු ඇත.[1] එසේ වුවද, ලබා දෙන ලද තොරතුරු වෙත ප්‍රවේශ වීමට ඔවුන්ට ඇති හැකියාව ඉතා අල්ප ය. මෙයට ඇති එකම ව්‍යතිරේකය වනුයේ ප්‍රතිචාර දක්වන්නා යතුරුපුවරු ක්‍රියාකාරිත්වය රහසේ වාර්තා කරගැනීම (keylogging) වැනි අවේක්ෂණයක් යටතේ පසු වීමයි, උදාහරණයක් ලෙස, සමීක්ෂණයේ සමහර ප්‍රතිචාර දක්වන්නන් ලබා දුන් ඇතැම් පිළිතුරු අනාරක්ෂිත විය හැකිය. මෙය සැලකිලිමත් විය යුතු දෙයක් නම්, සබැඳි අවේක්ෂණවලින් ආරක්ෂා වීම සඳහා අනෙකුත් මාර්ගෝපදේශ (අපගේ වෙබ් අඩවියේ ලැයිස්තුගත කර ඇත) අනුගමනය කරමින්, ප්‍රතිචාර දක්වන්නන්ට සම්පූර්ණ පාලනයක් ඇති විශ්වාසදායක, බෙදා නොගත් උපාංග භාවිතයෙන් සමීක්ෂණය සම්පූර්ණ කරන ලෙස අපි ප්‍රතිචාර දක්වන්නන් දැඩි ලෙස දිරිමත් කරමු.

HRMI වෙත Qualtrics හරහා ලැබෙන සමීක්ෂණ ප්‍රතිචාර අඥාත වේ, එනම් ලැබෙන ප්‍රතිචාර තනි සමීක්ෂණ ප්‍රතිචාර දක්වන්නෙක් හා සම්බන්ධ කිරීමක් සිදු නොවේ. කෙසේ වෙතත්, සපයා ඇති යම් ගුණාත්මක ප්‍රතිචාර දුර්ලභ අවස්ථාවන්වලදී සමහර ප්‍රතිචාර දක්වන්නන් හඳුනා ගැනීමට භාවිත කළ හැක. එබැවින් අප විසින් 1 (රහස්‍ය) සිට 3 (පොදු) දක්වා විවිධ මට්ටමේ දත්ත ආරක්ෂණ මට්ටම් 3ක් හඳුනාගෙන ඇත.

- 1 - රහස්‍ය: Qualtrics ඔස්සේ UGA හි HRMI කාර්ය මණ්ඩලය වෙත ලැබෙන මූලික අමු දත්ත තුළ ගුණාත්මක හා ප්‍රමාණාත්මක ප්‍රතිචාර අඩංගු වේ. සකස් කිරීමෙන් පසු මේවා Qualtrics සේවාදායකයෙන් මකා දමනු ලැබේ. ආරක්ෂණ පුහුණුවක් ලද සහ ඊට අදාළව පර්යේෂණ පවත්වන අයට පමණක් ඒ වෙත ප්‍රවේශය ලැබේ. ප්‍රතිචාර දක්වන්නන්ව හඳුනාගත හැකි සියලුම තොරතුරු අවසානයේ විනාශ වේ.
- 2 - පර්යේෂණ දත්ත: සම්පූර්ණයෙන්ම හඳුනා නොගත් සමීක්ෂණ ප්‍රතිචාර පර්යේෂණ සඳහා සහ HRMI ප්‍රමිතික ගණනය කිරීමට භාවිත කෙරෙන අතර එම දත්ත සම්පූර්ණයෙන්ම නිර්නාමික බැවින් ඒවාට විශේෂ ආරක්ෂාවක් අවශ්‍ය නොවේ. මෙම දත්ත HRMI ප්‍රකාශන සමඟ ප්‍රතිගුණන දත්ත ලෙස මාර්ගගතව බෙදා ගත හැක.
- 3 - පොදු: සමුච්චිත දත්ත HRMI ප්‍රමිතික ලෙස HRMI Rights Tracker හි ප්‍රකාශයට පත් කර ඇති අතර ඒවා HRMI වෙබ් අඩවියෙන් ඍජුවම බාගත හැක.

[1] මෙම අවධානම අවම කර ගැනීම සඳහා, අපි විභව සමීක්ෂණ ප්‍රතිචාර දක්වන්නන්ට මාර්ගගත ආවේක්ෂණවලින් ආරක්ෂා විය හැකි ආකාරය පිළිබඳ තොරතුරු සපයන්නෙමු.